# තීරණය

ලබන බ්‍රහස්පතින්දා පැවැත්වෙන ජනාධිපතිවරණය තවත් ජනාධිපතිවරණයක් පමණක් නොවන බව බොහෝ අවස්ථාවල බොහෝ දෙනා විසින් පැවසී ඇත. එය මෙරට ජාතික බලවේග හා විජාතික බලවේග අතර කෙරෙන සටනකි. මෙරට තවදුරටත් ඒකීය රටක් ලෙස පවතින්නේ ද නැත්නම් ඊළමකට මගපාදන සහසන්ධීය රාජ්‍යයක් බවට පත්වන්නේ ද යන්න එදින තීරණය කෙරෙනු ඇත. අප රටේ සංස්කෘතිය බටහිර නූතනත්වයේ පෞද්ගලික ඉන්ද්‍රිය පිනවීමේ සමාජ විරෝධී, පරිසර විරෝධී යටත්විජිතවාදී පාදඩ සංස්කෘතියෙන් ගලවාගන්නේ ද යන්න ද ලබන දහහත්වැනි දා තීරණු කෙරෙනු ඇත. අපේ ආර්ථිකය තව තවත් ඇමරිකන් හා වෙනත් ණය මත යැපෙන බටහිර යටත්විජිතවාදී හිඟන ආර්ථිකයක් වීමෙන් ගලවා අපේ දෙපයින් නැගීසිට හැකිතාක් අපට අවශ්‍ය දේ අප නිපදවන ආර්ථිකයක් ගොඩනගාගැනීම දිශාවට යොමුවන්නේ ද යන්න ද එදින තීරණය වනු ඇත. එමෙන් ම එදින මෙරට මහජනතාව තවත් වැදගත් තීරණයක් ගනු ඇත. එනම් ඉංගිරිසීන් විසින් අප මත පටවනු ලැබූ නායකයන් ඉන්පසු ඉවත්කෙරෙන්නේ ද යන්න ය.

එක් කතිරයකට මෙතරම් වැදගත්කමක් ලැබෙන අවස්ථා නූතන ඉතිහාසයේ ඉතා විරල ය. මුළු මහත් ජාතියක අනාගතය, නූපන් පරපුරක ඉරණම විසඳෙන්නේ ලබන බ්‍රහස්පතින්දා ය. සුද්දන් විසින් අපට දෙන ලද කතිරය ම යොදාගනිමින් සුද්දන්ගෙන් නිදහස්වීමේ සටන සම්පූර්ණකරගැනීමේ දිශාවට තවත් පියවරක් තැබීමේ අවස්ථාව ජාතියට ලැබී ඇත. ආපසු හැරී බලන විට අපට පෙනෙන වැදගත් කරුණක් වෙයි. මුළු මහත් බ්‍රිතානි යටත්විජිතයෙන් ම මුලින් ම සර්වජන ඡන්දය ලැබුණේ අපට ය. 1931 දී ලංකාවට සර්වජන ඡන්දය ලැබෙන විට බ්‍රිතානියේ ද කාන්තාවන්ට ඡන්දය ලැබී ගෙවී තිබුණේ වසර කිහිපයකි. සුද්දන් අපට එතරම් ඉක්මනින් ඡන්දබලය ලබාදුන්නේ ඇයි? අපේ ජනතාව අනෙක් යටත්විජිත රටවල් සමග සංසන්දනයකිරීමේ දී සාක්ෂරතාවෙන් ඉහළ මට්ටමක වූ නිසා ද? නැත, එයට හේතුව ඒ කිසිවක් නොව තමන් විසින් අපට ලබාදෙනු ලැබූ ඊනියා නායකයන් පිළිබඳ ව ඉංගිරිසින් ඇතිකරගෙන තිබූ විශ්වාසය ය. 1817-18 අපේ නායකත්වය මුළුමනින් ම මෙන් විනාශකළ ඉංගිරිසිහු ඔවුන් විසින් පුහුණු කෙරුණු, යටත්විජිතවාදී සංස්කෘතියක් පටවනු ලැබූ නායකයන් අපට ලබාදුන්හ. එදා සිට අපේ නායකයන් වී ඇත්තේ සුද්දන් දුන් නායකයන් හා ඔවුන්ගේ පරම්පරාවලින් පැවත එන්නන් ය. මොවුන් දැනසිටියේ ඉංගිරිසින් සමග සටන්කිරීමට නොව තමන් සුද්දන් මෙන් ජීවත්වන බැවින් සීමිත නිදහසකට සුදුසු බව පෙත්සම් මගින් සුද්දන්ට දැනුම්දීම ය. මේ දීන නායකයන් අතරින් පමණක් අපේ පාලකයන් තේරෙන්නේ යැයි විශ්වාසකළ ඉංගිරිසිහු අපට සර්වජන ඡන්දය ලබාදුන්හ. අනගාරික ධර්මපාලතුමාගෙන් පසුව අද ඒ තත්ත්වය පළමුවරට වෙනස් වී ඇත. ජාතික බලවේගවල අපේක්ෂකයා ලෙස එහි නායකයා ලෙස අද මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත්වී ඇත. ඒ මහතාගේ අපේක්ෂකත්වයට ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වය විජාතික බලවේගවල ආධාරයෙන් ලබාගෙන සිටි අයගේ විරුද්ධත්වයෙන් ම පෙන්නුම්කෙළේ ඉංගිරිසින් විසින් පත්කෙරුණු ලැබූ නායකයන් තවදුරටත් රැකගැනීමට විජාතික බලවේගවලට ඇති අවශ්‍යතාව ය. (බණ්ඩාරනායක මහතා ද උපත ලැබුයේ සුද්දන් විසින් නායකත්වයට පත්කරනු ලැබූ පරම්පරාවක ය. එහෙත් තම පරම්පරාවේ දීනත්වයෙන් මිදීමට තරම් අන්තර්ඥානයක් ඒ මහතා සතුවිය.) ජනාධිපතිවරණයෙන් යම් අයුරකින් රනිල් වික්‍රමසිංහ මහතා ජයග්‍රහණය කළහොත් (එසේ වීමට ඉඩක් නැති නමුදු තර්කය සඳහා ඒ උපකල්පනය කරමු.) එහි ප්‍රතිඵලය වනුයේ එ ජා පක්ෂයේ මෙන් ම, ශ්‍රී ල නි පක්ෂයේ ද නායකත්වය තවදුරටත් ඉංගිරිසින් විසින් පත්කරන ලද පුද්ගලයන්ට හිමිවීම ය.

මහින්ද රාජපක්ෂ මහතාගේ මහින්ද චින්තන මෙරට චින්තනයෙහි ප්‍රධාන සංරචකයක් වූ මිහිඳු හිමියන්ගේ චින්තනය මත පදනම් වෙයි. මෙරට ජාතික දේශපාලන ව්‍යුහය වූයේ එක්සේසත් රාජ්‍යයකි. දුටුගැමුණු රජතුමාගේ කාලයේ ද මෙරට එක්සේසත් රාජ්‍යයක් විය. ඒකීය යනු එක්සේසත් මිස වෙනත් දෙයක් නො වෙයි. රාජපක්ෂ මහතා ඒකීය හෙවත් එක්සේසත් රාජ්‍යය රැකගැනීමට ප්‍රතිඥා දී ඇත. එහෙත් වික්‍රමසිංහ මහතා පෙනී සිටින්නේ පැහැදිලිව ම සහසන්ධීය රාජ්‍යයක් වෙනුවෙන් ය. ඔහු අතීතයේ දී අසමමිතික බලය බෙදීමක් ගැන කතා කෙළේ ය. අද දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයට එහා යන ඊනියා විසඳුමක් ගැන කතාකරයි. ඒ අතර හමුදා බලසේනාංක පහකට පමණක් සීමාකර ඒකාබද්ධ හමුදාවක් ඇතිකිරීමට අරඅඳියි. ඔහු ඔස්ලෝ ගිවිසුම පිළිගනියි. ඒ ගිවිසුම අනුව කිසිදු ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක හෝ සාක්ෂියක් නොමැතිව උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ නිජභූමි ලෙස සැලකෙයි.

© Prof. Nalin De Silva

1889 දී අවසන් වරට ඉංගිරිසින් විසින් ලකුණුකර වෙන්කරන ලද පළාත් දෙකක් ඊනියා ඓතිහාසික වාසභූමියක් හෝ නිජභූමියක් හෝ වන්නේ යැයි කීම හාස්‍යයට කරුණක් නමුදු මේ සිනහසීමට අවස්ථාවක් නො වෙයි. ඔස්ලෝ ගිවිසුම මත පදනම්ව අත්සන්කරන ලද ඊනියා සටන් විරාම ගිවිසුමෙන් වික්‍රමසිංහ මහතා ලංකා රජය හා කොටි සංවිධානය සම තත්ත්වයෙහි ලා සැලකීමට සැලැස්වී ය. එමෙන් ම ඔහු ලංකාණ්ඩුවේ හමුදා සහ කොටි ත්‍රස්තවාදී කල්ලිය එක සමාන ලෙස සැලකී ය. මේ සියල්ල එකට ගත්කල කියැවෙන්නේ ඔහු ලංකාව හා ඊළමක් යනුවෙන් රාජ්‍ය දෙකක් ඇතිකර ඒ රාජ්‍ය නාමික වශයෙන් එක්කිරීමට යන බව ය. එසේ එක්කළ විට ලැබෙන්නේ සහසන්ධීය රාජ්‍යයකි. එය නාම මාත්‍රික ය.  ඒ රාජ්‍ය දෙකට වෙන වෙන ම පාර්ලිමේන්තු, වෙන වෙන ම අධිකරණ, වෙන වෙන ම පොලිස් හා වෙන වෙන ම හමුදා තිබෙනු ඇත. ඒ හමුදා එක්කර ඊනියා ඒකාබද්ධ හමුදාව නිර්මාණයවනු ඇත.  නාම මාත්‍රික වූ සහසන්ධීය රාජ්‍යයෙන් වෙන් වී වෙනම ම ඊළමක් පිහිටුවීම සුළු කරුණකි.

පනස්හය යනු බ්‍රිතානීන්ට එරෙහිව අප කළ හතරවැනි ප්‍රධාන නිදහස් සටන ය. පළමු සටන් තුන වූයේ 1817-18, 1848 හා අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය ය. 1948 ලැබුණු සීමිත නිදහස සුද්දන්ගෙන් කළුසුද්දන්ට ලැබුණු එකක් බව වටහාගත් ජාතික බලවේග 1954 පමණ සිට තමන්ට හිමි දෑ ලබාගැනීම සඳහා එකරාශී වූහ. එහි ප්‍රතිඵලය වූයේ බෞද්ධ කොමිෂන් සභාව හා එහි වාර්තාව ය. ඒ වාර්තාව බණ්ඩාරනායක මහතා පිළිගැනීමෙන් පසු එහි නිර්දේශ ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති බවට පත්විය. මේ ප්‍රතිපත්ති යම් ප්‍රමාණයක් 1956, 1960 ජුලි හා 1970 ආණ්ඩු විසින් ක්‍රියාත්මක කෙරිණි. ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ව්‍යවස්ථාවෙන් ම ප්‍රකාශ වූ අතර, පාසල් විශාල ප්‍රමාණයක් රජයට පවරාගන්නා ලදී. එහි වූ ආර්ථික වැඩ පිළිවෙල ජනතාවට තේරුමක් දෙන අයුරින් ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලය වූයේ 1977 දී ජේ අර් ජයවර්ධන මහතා බලයට පත්වීම හා පනස්හයේ ප්‍රතිපත්ති කණපිට හැරවීම ය. ඊනියා විවෘත ආර්ථිකයක් ඔස්සේ අපේ නිෂ්පාදන නැතිකෙරුණු අතර, ලංකාව ණයට කන හිඟන රටක් බවට පත්විණි. ඒ අතර බටහිර නූතනත්වයේ පුද්ගලවාදී ඉන්ද්‍රිය පිනවීම එකම දහම කරගත් පාදඩ සංස්කෘතිය රටේ පැතිරවිණි. ඒ සඳහා ජනමාධ්‍ය නමින් වූ ජඩමාධ්‍ය බුකිකරුවන්, උගස්ගන්නන්, මහාරාජාවරුන්, පනස්හයට හා අනගාරික ධර්මපාලතුමාට පහරදුන් ලේක්හවුසියේ අයිතිකරුවන් වූ ද ජයවර්ධනලාගේ හා වික්‍රමසිංහලාගේ නෑයන්වූවන් විසින් බිහිකෙරිණි. බටහිර නූතනත්වයේ අවශ්‍යතාව පරිදි භාෂාව මරමින් සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමට කටයුතුකිරීම මේ ජඩමාධ්‍යවල ප්‍රතිපත්තිය විය. මෙරට මිනිසුන් හිතනහැටි වෙනස්කිරීමට කසිකබල් මහාචාර්යවරු රජයේ රූපවාහිනී නාලිකාවලට පත්කෙරිණි. රාජ්‍ය නොවන සංවිධාන හතුපිපෙන්නාක් මෙන් බිහිකෙරිණි. ඒ පිටුපස වූයේ බටහිර රටවල් ය. ඒ සංවිධානවල කුලීකරුවෝ තම කායික මෙන් ම මානසික ශ්‍රමය ද බටහිරයන්ට විකුණූහ. මානසික ශ්‍රමය විකුණූවෝ ඊනියා ප්‍රබුද්ධ උගතුන් ලෙස පෙනීසිටිමින් බටහිර යටත්විජිතවාදී මත මෙරට වැපිරූහ. දෙමළ ජාතිවාදය හා කොටි සංවිධානය වෙනුවෙන් පෙනී සිටියහ. ඇතැම්හු හමුදාවට විරුද්ධව චිත්‍රපටි අධ්‍යක්ෂණයකළහ. ඒ අතර බෞද්ධ විරෝධී රක්ෂණ බැංකු කරුවෝ සිංහල බෞද්ධකමට එරෙහිව බොරු සාම සංවිධාන පිහිටුවාගත්හ.

සිංහල බෞද්ධ සංස්කෘතිය සියල්ලටම වැරදිකරුවා ලෙස පෙන්නුම් කෙරිණි. සිංහල බෞද්ධ සංස්කෘතිය විසින් අනෙක් සංස්කෘතීන් පාගාදැමෙන්නේ යැයි චෝදනාකෙරිණි. එසේ කෙරුණේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝකයේ එකම සංස්කෘතිය බවට පත්කිරීමට කැසකවන බටහිර නූතනත්වයේ අනුග්‍රහයෙනි. එහෙත් ලංකාවේ බෞද්ධ නොවන සංස්කෘතීන්ට ඇති නිදහස ලෝකයේ කිසිම බෞද්ධ නොවන රටක ඒ ඒ රටවල ප්‍රධාන සංස්කෘතිය නොවන සංස්කෘතියකට නැත. ලංකාවේ මේ සියළු චෝදනා නැගෙන්නේ බෞද්ධ සංස්කෘතියට ප්‍රධාන සංස්කෘතිය නොව තවමත් ක්‍රිස්තියානි සංස්කෘතියට හිමිතැනවත් නොමැති විටක දී ය. මෙරට දෙමළ හින්දු, මුස්ලිම් පමණක් නොව කතෝලික සංස්කෘතිය ද රැකෙනු ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතිය රැකුණහොත් පමණකි. සිංහල බෞද්ධ සංස්කෘතිය පමණ අනෙක් සංස්කෘතීන්ට ඉඩදුන්, රැකගත් සංස්කෘතියක් ලෝකයේ තවත් නැත. මෙරට ප්‍රශ්නය සිංහල බෞද්ධ සංස්කෘතික ආධිපත්‍යයක් නොව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය යටතේ සිංහල සංස්කෘතියට එයට හිමිතැන නො ලැබීම ය. පනස්හයේ දී ඒ හිමිතැන ලබාගෙන බටහිර ආධිපත්‍යයෙන් නිදහස්වීමට යම් පියවර ගැණිනි. 1977න් පසු ඒ සියල්ල කණපිට හැරිණි. අද පනස්හයේ දරුවන්ගේ නායකත්වයෙන් ජාතික බලවේග පනස්හය ඉදිරියට ගෙනයමින් අසූවේ දශකයේ අගභාගයේ ඇරඹි, මෙරට බ්‍රිතානි යුගයේ පටන්ගත් නිදහස් සටනේ පස්වැනි යුගයේ වැදගත් සන්ධිස්ථානයකට පත්ව ඇත. මේ පස්වැනි යුගයේ දී ජාතික මතවාද දැනටමත් ජයග්‍රහණය කරඇත. එහි දේශපාලන ජයග්‍රහණය පිළිබඳ තීරණය ලබන බ්‍රහස්පතින්දා ගැනෙනු ඇත.

© Prof. Nalin De Silva